9. මධ්‍යකාලීන සිංහල ක්‍රියාපදය පිළිබඳ බුත්සරණින් හෙළි වන තොරතුරු 155-166
වින්ධ්‍යා වීරවර්ධන

10. බෞද්ධ ප්‍රතිපත්ති පූරණයෙහි ලා පූජා චාරිත්‍රවල උපයෝගීතාව 167-186
රන්ජනී මලවි පතිරණ

11. සංශයවාදය හා ආදි බෞද්ධ චින්තනය අතර සමානතා පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් 187-211
දිල්ශාන් මනෝජ් රාජපක්ෂ

12. ඵලදායී අධ්‍යාපනයක් උදෙසා ශිෂ්‍ය විවිධත්වය හසුරුවා ගැනීමේ දී සංගීත ගුරුවරයාගේ කාර්යභාරය පිළිබඳ විමසුමක් 212-228
පී. ඒ. අමිල මදුසංක

13. මහාවිහාරය හා ථේරවාද බෞද්ධ සම්ප්‍රදාය 229-241
ආචාර්ය පූජ්‍ය දුනුකේඋල්ලේ සාරානන්ද හිමි

14. සීතාවක රාජසිංහයන් හා සබැඳි දේවෝත්පත්ති කතාව හෙවත් ගනේගොඩ දේවතා සංකල්පය 242-261
එම්. බී. බුද්ධික ජයසුන්දර

15. සිදත්සඟරාවේ ව්‍යාකරණ රීති පිළිබඳ ව මහාචාර්ය ඩබ්ලිව්. එස්. කරුණාතිලක සූරීන්ගේ විග්‍රහය පිළිබඳ ව අධ්‍යයනයක් 262-289
ආචාර්ය අනුරින් ඉන්දිකා දිවාකර




# සිංහල අත්තනෝ පද ක්‍රියා ව්‍යවහාරය

පූජ්‍ය ඔක්කම්පිටියේ පඤ්ඤාසාර හිමි

Like in Pali and Sanskrit Languages, the Sinhala verb is divided into "Parassa Pada" and "Attano Pada" Of the two types of verbs in Sinhala, very little attention has been devoted to the usage of the two categories by grammarians.
Very little has been said on the issue by Professor Senarath Paranavithana (Seegiri Gee Vierana). Wilhelm Geiger (Sinhala Basha Viyakarana) and Kumaratunga Munidasa (Kavya Vivaranaya), While taking into consideration the contributions of the above mentioned scholars, the aim of this paper is to further investigate the category of verbs which comes under "Attano Pada."

පාලි සංස්කෘත භාෂාවල මෙන් ම සිංහල භාෂාවෙහි ද පරස්ස පද හා අත්තනෝ පද ක්‍රියා වශයෙන් ක්‍රියා ප්‍රභේදයක් පවතී. ඒ අතර අත්තනෝ පද ක්‍රියා ව්‍යවහාරය පිළිබඳ විද්වතුනගේ අවධානය යොමු වී ඇත්තේ ඉතා අල්ප වශයෙනි. සෙනරත් පරණවිතාන, විල්හෙල්ම් ගයිගර්, කුමාරතුග මුනිදාස වැනි විද්වතුන් විසින් රචනා කරන ලද, පිළිවෙළින් **සීගිරි ගී වියරණ, සිංහල භාෂාවේ ව්‍යාකරණය, ක්‍රියා විවරණය** යන කෘතිවල අඩු වශයෙන් අත්තනෝ පද ක්‍රියා පිළිබඳ සඳහන් වෙයි. එම කෘතිවල සංක්ෂිප්ත වශයෙන් සඳහන් වන කරුණු ද සැලකිල්ලට ගනිමින් සිංහල භාෂාවේ ව්‍යවහාර වන අත්තනෝ පද ක්‍රියා පිළිබඳ විමර්ශනයක් කිරීම මෙම ලිපියෙහි අභිප්‍රාය වෙයි.

පාලි සංස්කෘත ව්‍යාකරණය ග්‍රන්ථවල අත්තනෝ පද හා පරස්ස පද ක්‍රියා හඳුන්වා ඇත්තේ මෙපරිද්දෙනි.

---

© **මහාචාර්ය පූජ්‍ය ඔක්කම්පිටියේ පඤ්ඤාසාර හිමි**

සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු
**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 22 කලාපය, 2014/2015**
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

'පරස්ස අත්ථ භූතානි පදානි පරස්ස පදානි, අත්තනෝ අත්ථ භූතානි පදානි අත්තනෝ පදානි'[1]
'පරස්ස අභිධායකානි පදානි පරස්ස පදානි, අත්තනෝ අභිධායකානි පදානි අත්තනෝ පදානි'[2]
'ආත්මගාමී චේත් ඵලමාත්මනේ පදම්. පරගාමී චේත් පරස්මෛපදං'[3]

ඉහත සඳහන් විග්‍රහයන් ගෙන් පෙනීයන්නේ ක්‍රියාවෙහි ඵලය අන්‍යයන් කරා යයි නම් එය පරස්ස පද ක්‍රියා ලෙසත් ක්‍රියාවේ ඵලය තමා කරා එයි නම් එය අත්තනෝ පද ක්‍රියා ලෙසත් පාලි සංස්කෘත ව්‍යාකරණ ආචාර්යවරයන් විසින් පිළිගෙන පැවැති බවයි. එම ව්‍යාකරණඥයන් කෙසේ පැවසුව ද පරස්ස පද හා අත්තනෝ පද භේදය කිසිසේත් අර්ථය හා සම්බන්ධ වූවක් නොවේ. මෙම අත්තනෝ පද හා පරස්ස පද ක්‍රියාවල වෙනස ඇත්තේ රූපයෙහි පමණි. බොහෝ කලක් භාෂාව ව්‍යවහාරයේ යෙදෙන කල එක ම අර්ථය සඳහා විවිධ රූප ඇති වීම ස්වභාවයකි. එක ම අර්ථ ඇති විවිධ ක්‍රියා රූප එකිනෙක වෙන්කොට දැක්වීම සඳහා ව්‍යාකරණ ආචාර්යවරයන් විසින් අත්තනෝ පද හා පරස්ස පද ක්‍රියා ව්‍යවහාරය සිදු කළ බව පෙනේ.

සිංහල භාෂා ඉතිහාස පරීක්ෂා කිරීමේ දී සිංහල ප්‍රාකෘත (ක්‍රි.පූ. 3/2 සිට ක්‍රි. ව. 3/4 තෙක්) පුරාතන සිංහල (ක්‍රි. ව. 4 සිට 7 තෙක්) යුගවලට අයත් දහස් ගණන් ශිලාලිපි අතර අත්තනෝ පද ක්‍රියා රූප දක්නට නොලැබෙයි. කිසියම් භාෂාවක අත්තනෝ පද ක්‍රියා නිපදෙන්නේ භාෂාවේ සංවර්ධනයේ ප්‍රතිඵලයක් වශයෙනි. ඉහත සඳහන් යුග සිංහල භාෂාවේ ප්‍රාරම්භක අවස්ථාවන් බැවින් අත්තනෝ පද ක්‍රියා රූප නොවී යැයි නිගමනය කළ හැකිය. එහෙත් ඇතැම් විට ව්‍යවහාරයේ පවතින්නට ඇත. මධ්‍යතන සිංහල යුගයේ සිට එනම් ක්‍රි. ව 8 වන සියවසේ සිට අත්තනෝ පද ක්‍රියා රූප සිංහල භාෂාවේ හමුවෙයි. සෙනරත් පරණවිතාන සූරීන් අත්තනෝ පද ක්‍රියා රූප රැසක් **සීගිරි ගී වියරණයෙහි** සංග්‍රහ කොට දක්වා ඇත.[4]

| | | |
|---|---|---|
| දිසෙයි | (50) | දක්නා ලැබෙයි |
| වැහවෙත් | (65) | ඉවසති |
| පැනෙයි | (83) | පෙනේ |
| වැසෙයි | (93) | වැසෙයි |



| | | |
|---|---|---|
| දෙනෙයි | (102) | දැනෙයි |
| ජැනෙන්නෙයි | (148) | දැනෙන්නේය |
| ගෙණෙත් | (181) | ගණනය කෙරෙත් |
| හැජවෙයි | (200) | අදවනු ලබයි |
| ගැන්වෙයි | (228) | ගැනේ |
| අස් වැසෙයි | (263) | අස්වැසෙයි |
| සිතෙයි | (358) | සිතෙයි |
| රෙන්දෙ | (399) | රැඳෙයි |
| තැවෙයි | (405) | තැවෙයි |
| ඇදෙත් | (463) | ඇදෙත් |
| නැමෙ | (470) | නැමෙයි |
| සෙලෙති | (473) | චලනය වෙති |
| සිතෙන්නෙයි | (478) | සිතෙන්නේය |
| හෙජෙයි | (429) | ඇදෙයි |
| එළෙයි | (540) | වැටෙයි |
| පෙළෙයි | (549) | පීඩාවෙයි |
| මිරිකෙයි | (549) | මිරිකෙයි |
| විද්හෙ | (582) | විකසිත විය, පිපුණි |
| හැවැලෙ | (628) | ඇවිළේ |

එහෙත් ඉහත සඳහන් ක්‍රියා රූප පරීක්ෂාකර බැලීමේදී ගැටලු කීපයක් අපට මතුවෙයි. පොදු පිළිගැනීමට අනුව අත්තනෝ පද ක්‍රියාරූප හා පරස්ස පද ක්‍රියා රූප අර්ථ වශයෙන් සමාන වෙයි. රූප වශයෙන් අසමාන වෙයි. අත්තනෝ පද ක්‍රියා වශයෙන් පරණවිතාන දක්වන නිදසුන් බොහොමයක් පරස්ස පද ක්‍රියා සමග ගැළපීමේදී අර්ථ වශයෙන් අසමාන වෙයි. නිදසුන් පරීක්ෂා කර බැලීමේ දී මේ කරුණද වඩාත් පැහැදිලි වෙයි.

| | | | | | |
|---|---|---|---|---|---|
| දිසෙයි | (50) | දක්නට ලැබෙයි | - | දකියි | (පරස්ස) |
| වැසෙයි | (93) | වැසෙයි | - | වසයි | (පරස්ස) |
| දෙනෙයි | (102) | දැනෙයි | - | දනියි | (පරස්ස) |
| ගෙණෙත් | (181) | ගණනය කෙරෙත් | - | ගණිත් | (පරස්ස) |
| හැජවෙයි | (200) | අදවනු ලබයි | - | අදියි | (පරස්ස) |
| ගැන්වෙයි | (228) | ගැනේ | - | ගනියි | (පරස්ස) |

| | | | | | |
|---|---|---|---|---|---|
| අස්වැසෙයි | (263) | අස්වැසෙයි | - | අස්වසයි | (පරස්ස) |
| සිතෙයි | (358) | සිතෙයි | - | සිතයි | (පරස්ස) |
| රෙන්දෙ | (399) | රැඳෙයි | - | රඳයි | (පරස්ස) |
| තැවෙයි | (405) | තැවෙයි | - | තවයි | (පරස්ස) |
| ඇදෙත් | (463) | ඇදෙත් | - | අදිත් | (පරස්ස) |
| නැමෙ | (470) | නැමෙයි | - | නමයි | (පරස්ස) |
| සෙලෙති | (473) | චලනය වෙති | - | සලත් | (පරස්ස) |
| සිතෙන්නෙයි | (478) | සිතෙන්නේය | - | සිතන්නේය | (පරස්ස) |
| හෙජෙයි | (529) | ඇදෙයි | - | අදියි | (පරස්ස) |
| පෙළෙයි | (549) | පීඩාවෙයි | - | පෙළයි | (පරස්ස) |
| මිරිකෙයි | (549) | මිරිකෙයි | - | මිරිකයි | (පරස්ස) |
| හැවලෙ | (628) | ඇවිලේ | - | අවුළයි | (පරස්ස) |

පරණවිතාන සූරීන් විසින් සපයා ඇති නිදසුන්වල අත්තනෝ පද ක්‍රියා රූප වශයෙන් සැලකිය හැක්කේ කීපයක් පමණි.

| | | | |
|---|---|---|---|
| පැනෙයි | (83) | පෙනේ | (අත්තනෝ පද) |
| ජැනෙන්නෙයි | (148) | දැනෙන්නේය | (අත්තනෝ පද) |
| එළෙයි | (540) | වැටෙයි | (අත්තනෝ පද) |
| විද්හෙ | (582) | විකසිත විය/පිපුණි | (අත්තනෝ පද) |

පරණවිතාන සූරීන් විසින් අත්තනෝ පද වශයෙන් දක්වන ලද ක්‍රියා රූප නිරුත්සාහක හෝ කර්මකාරක හෝ භාවකාරක ක්‍රියාරූප වශයෙන් හෝ වර්ගීකරණය කළ හැකිවෙයි. එහෙත් අත්තනෝ පද ක්‍රියා රූප රූපමය වශයෙන් කර්මකාරක, භාවකාරක හා නිරුත්සාහක ක්‍රියා සමග සමාන වුව ද අර්ථමය වශයෙන් අසමාන වෙයි.

මෙය වඩාත් හොඳින් පැහැදිලි වීම සඳහා අත්තනෝ පද ක්‍රියා රූප පරස්ස පද රූප සමග වාක්‍යවල යෙදීමෙන් එම ක්‍රියා රූප දෙකෙහි ම අර්ථමය වශයෙන් ඇති සාම්‍යය වැටහී යනු ඇත.

| | |
|---|---|
| වතුර **උතුරයි** | **පරස්ස පද** |
| වතුර **ඉතිරෙයි** | **අත්තනෝ පද** |
| ළමයෙක් **උපදියි** | **පරස්ස පද** |



| | |
|---|---|
| ළමයෙක් **ඉපදෙයි** | **අත්තනෝ පද** |
| කොටය **දිරයි** | **පරස්ස පද** |
| කොටය **දිරෙයි** | **අත්තනෝපද** |
| ළමයා ගෙදර **නවතියි** | **පරස්ස පද** |
| ළමයා ගෙදර **නවතෙයි** | **අත්තනෝ පද** |
| ගිනිනෙන් දුම් **නිපදී** | **පරස්ස පද** |
| ගින්නෙන් දුම් **නිපදෙ** | **අත්තනෝ පද** |
| ළමයා **පරදියි** | **පරස්ස පද** |
| ළමයා **පැරදෙයි** | **අත්තනෝ පද** |
| විද්‍යාලය හොඳින් **පවතියි** | **පරස්ස පද** |
| විද්‍යාල හොඳින් **පැවතෙයි** | **අත්තනෝ පද** |
| ශ්‍රාවකයා ධර්මයට **පහදියි** | **පරස්සපද** |
| ශ්‍රාවකයා ධර්මයට **පැහැදෙයි** | **අත්තනෝ පද** |
| බෝම්බ **පුපුරයි** | **පරස්ස පද** |
| බෝම්බ **පිපිරෙයි** | **අත්තනෝ පද** |
| ළමයා පාන්දර **පුබුදියි** | **පරස්ස පද** |
| ළමයා පානදර **පිබිදෙයි** | **අත්තනෝ පද** |
| ගොයම් **පුහුදිය** | **පරස්ස පද** |
| ගොයම් **පීදෙයි** | **අත්තනෝ පද** |
| සඳ **බබළයි** | **පරස්ස පද** |
| සඳ **බැබළෙයි** | **අත්තනෝ පද** |
| ලෝකය **බමයි** | **පරස්ස පද** |
| ලෝකය **බැමෙයි** | **අත්තනෝ පද** |
| ළමයා ගෙදර **රඳයි** | **පරස්ස පද** |
| ළමයා ගෙදර **රැඳෙයි** | **අත්තනෝ පද** |
| සොරා ගෙට **වදියි** | **පරස්ස පද** |
| සොරා ගෙට **වැදෙයි** | **අත්තනෝ පද** |
| ඔහු **වළපියි** | **පරස්ස පද** |
| ඔහු **වැළපෙයි** | **අත්තනෝ පද** |
| පියා ගෙදර **වසයි** | **පරස්ස පද** |
| පියා ගෙදර **වෙසෙයි** | **අත්තනෝ පද** |
| ආලෝකය **විහිදයි** | **පරස්ස පද** |
| ආලෝකය **විහිදෙයි** | **අත්තනෝ පද** |
| භික්ෂුව ධ්‍යානයට **සමවදියි** | **පරස්ස පද** |

| | |
|---|---|
| භික්ෂුව ධ්‍යානයට **සමවැදෙයි** | **අත්තනෝ පද** |
| මම ගෙදර **යමි** | **පරස්ස පද** |
| මම ගෙදර **යෙමි** | **අත්තනෝ පද** |
| ඔහු වේදිකාවට **නඟියි** | **පරස්ස පද** |
| ඔහු වේදිකාවට **නැගෙයි** | **අත්තනෝ පද** |
| ගුරුවරුන්ට අකුරු වරදියි | පරස්ස පද |
| ගුරුවරුන්ට අකුරු **වැරැදෙයි** | **අත්තනෝ පද** |
| ඔහු වනයේ **සරයි** | **පරස්ස පද** |
| ඔහු වනයේ **සැරෙයි** | **අත්තනෝ පද** |
| ශිෂ්‍යයා ගුරුන් අනුව **යයි** | **පරස්ස පද** |
| ශිෂ්‍යයා ගුරුන් අනුව **යෙයි** | **අත්තනෝ පද** |

ඉහත සඳහන් පරස්ස පද හා අත්තනෝ පද ක්‍රියා රූප පිරික්සීමේ දී එම සියලු ක්‍රියාවල ධාතුව හෙවත් මූලය අකර්මක බව පෙනේ.

එහෙත් සකර්මක ක්‍රියාවලින් ද අත්තනෝ පදවලට සමාන ක්‍රියා රූප නිපදෙතත් ඒවා අත්තනෝ පද ක්‍රියා රූප ලෙස සැලකිය නොහැකි වෙයි. එයට හේතුව අර්ථමය වශයෙන් අසමාන වීමයි. එම ක්‍රියා රූප කර්මකාරක හෝ නිරුත්සාහක ක්‍රියා රූප ගොනුවට එකතු කළ හැකි වෙයි.

| | |
|---|---|
| විෂ්ණු කිරි මුහුද කලඹයි | (කර්තෘකාරක පරස්ස පද ක්‍රියා) |
| විෂ්ණු විසින් කිරි මුහුද කැලඹෙයි | (කර්මකාරක ක්‍රියා) |
| කිරි මුහුද කැලඹෙයි | (නිරුත්සාහක ක්‍රියා) |

ඉහත සඳහන් වාක්‍යවල '**කැලඹෙයි**' යන කර්මකාරක ක්‍රියාවත් '**කැලඹෙයි**' යන නිරුත්සාහක ක්‍රියාවත් රූපමය වශයෙන් අත්තනෝ පද ක්‍රියාවලට සමානය. එහෙත් අත්තනෝ පද ක්‍රියා රූප නොවෙයි.

තවත් නිදසුන් කීපයක් විමසා බැලීමෙන් මෙය මනාව වැටහෙයි. ඇතැම් ධාතු සකර්මත/ අකර්මක යන දෙකට ම අයත් වෙයි. එම ධාතුවලින් නිපන් අකර්මක ක්‍රියා අත්තනෝ පද ක්‍රියාවල



ස්වරූපය උසුලයි. එහෙත් ඒවා ද අත්තනෝ පද ක්‍රියා ලෙස සැලකිය නොහැකිය.

| | |
|---|---|
| 'අඹර' ඇඹරීමෙහි ධාතුව | (සකර්මක/අකර්මක) |
| මෙහෙකරුවා ලනුවක් අඹරයි | (සකර්මක) |
| ලනුව ඇඹරෙයි | (අකර්මක) |
| 'වන' වැනීමේ ධාතුව | (සකර්මක/අකර්මක) |
| ළමයා අත වනයි | (සකර්මක) |
| කොඩිය වැනෙයි | (අකර්මක) |

මෙම වාක්‍ය දෙකෙහි '**ඇඹරෙයි**' '**වැනෙයි**' යන ක්‍රියා රූප අත්තනෝ පද ක්‍රියා ලෙස කුමාරතුංග මුනිදාස මහතා ක්‍රියා විවරණයෙහි සඳහන් කරතත් ඒවා අත්තනෝ පද ක්‍රියා රූප නොවේ. එයට හේතුව '**අඹරයි**' '**වනයි**' යන පරස්ස පද ක්‍රියා රූප සමග '**අඹරයි**' , '**වැනෙයි**' යන ක්‍රියා රූප අර්ථයෙන් අසමාන බැවිනි. එබැවින් කුමාරතුංග මුනිදාස මහතා ක්‍රියා විවරණයෙහි දක්වන ඇතැම් ක්‍රියා අත්තනෝ පද ක්‍රියා ලෙස සැලකිය නොහැකිය.

ඇතැම් ක්‍රියා අත්තනෝ පදය පමණක් නියෝජනය කරයි. මෙ ක්‍රියා අකර්මක ධාතු මූලයන්ගෙන් නිපන් ඒවා බව පෙනේ.

| | |
|---|---|
| ඔහු ධර්මයෙහි **ඇලෙයි** | අත්තනෝ පද |
| ඔහු නිවසින් **නික්මෙයි** | අත්තනෝ පද |
| ඔහු **කලකිරෙයි** | අත්තනෝ පද |
| වාහනය මඩෙහි **එරෙයි** | අත්තනෝ පද |
| ඔහු ගෙට **එළඹෙයි** | අත්තනෝ පද |
| ළමයා පාසලින් **නික්මෙයි** | අත්තනෝ පද |
| ළමයා ඉගෙනීමෙහි **නියළෙයි** | අත්තනෝ පද |
| රහතන්වහන්සේ **පිරිනිවෙයි** | අත්තනෝ පද |
| ඔහු ගෙට **පිවිසෙයි** | අත්තනෝ පද |
| සේවකයා වැටුපෙන් **යැපෙයි** | අත්තනෝ පද |
| ගුරුවරයා පන්තියට **පැමිණෙයි/ සපැමිණෙයි** | අත්තනෝ පද |
| පළතුරු **ඉදෙයි** | අත්තනෝ පද |
| ඔළුව **ඉදිමෙයි** | අත්තනෝ පද |

| | |
|---|---|
| රජු **කිපෙයි** | අත්තනෝ පද |
| පය **පැකිළෙයි** | අත්තනෝ පද |
| ගොයම් **පැසෙයි** | අත්තනෝ පද |
| ධර්මය **පිරිහෙයි** | අත්තනෝ පද |
| දරුවෙක් **පිළිසිඳෙයි** | අත්තනෝ පද |
| මල් **පිපෙයි** | අත්තනෝ පද |
| හද **රිදෙයි** | අත්තනෝ පද |
| කොඩිය **ලෙළෙයි** | අත්තනෝ පද |
| ශරීරය **වැහැරෙයි** | අත්තනෝ පද |
| ජලාශය **සිඳෙයි** | අත්තනෝ පද |

එහෙත් සෑම අකර්මක ක්‍රියාවකින් ම අත්තනෝ පදක්‍රියා සිද්ධ නොවේ.

| | | |
|---|---|---|
| ළමයා **නිදයි** | අකර්මක | පරස්ස පද |
| ළමයා **නිදෙයි** | | ? |
| භික්ෂුව දනට **වඩියි** | අකර්මක | පරස්ස පද |
| භික්ෂුව දනට **වැඩෙයි** | | ? |

අකර්මක ධාතුවකින් වර්තමාන හෝ වර්තමාන (අනාගත) අත්තනෝ පද ක්‍රියා පද සාධනයේ දී ධාතුවේ අන්ත ස්වරය නිත්‍ය වශයෙන් 'එ'බවට පත්වී ස්වර විපර්යාසයන්ට භාජනය වෙයි. අතීත අත්තනෝ පද ක්‍රියාරූප සාධනයේ දී කර්මකාරක ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය උපයෝගී කරගනු ලැබේ. ඒ පිළිබඳ මතු සඳහන් වෙයි.

අල - ඇලුම්හි ධාතුව
අල + එ + යි - ඇලෙයි

ඉඳ - ඉඳුම්හි ධාතුව
ඉඳ + එ + යි - ඉඳෙයි

උපද - ඉපදුම්හි ධාතුව
උපද + එ +යි - ඉපදෙයි

එළඹ + එළඹුම්හි ධතුව
එළඹ + එ + යි + එළඹෙයි

කුප් - කිපීමෙහි ධාතුව
කුප් + එ + යි - කිපෙයි



මෙම අත්තනෝ පද ක්‍රියා රූප කර්මකාරක හා භාවකරක ක්‍රියා රූප හා සමානාත්මතාවක් උසුලයි. ඒ බව පාලි වියරණ ඇදුරන් විසින් ද පවසනු ලැබ ඇත.

**අත්තනෝ පදානි භාවේච කම්මනි**
**භාවේ ච කම්මනි ච අත්තනෝ පදානි හොන්ති**[5]
(ආත්මනේ පදයෝ භාවාර්ථයෙහි ද කර්මකාරකයෙහි ද වෙත්. භාවර්ථයෙහි ද කර්මකාරකයෙහි ද ආත්මනේ පදයෝ වෙත්)

**අතීත කර්ම කාරක ක්‍රියාව/ ආඛ්‍යාතය**

සිදත් සඟරාවේ කර්මකාරක ක්‍රියා පිළිබඳ සපයන නිදසුන් හා විවරණ පිරික්සීමේ දී ඒවා අත්තනෝ පද ක්‍රියා සමග පවත්නා සම්බන්ධය මොනවට පැහැදිලි වෙයි.

**අග මඟ ගින්නෙන් කෙලෙස් කැස දැවිණි.**
(අග්‍ර මාර්ග ගින්නෙන් (ගින්න විසින්) කෙලෙස් ළැහැබ දැවිණි/ දවනු ලැබීය.)

මෙම වැකියෙහි '**දැවිණි**' යනු කර්මකාරක අතීත ක්‍රියා රූපය වන අතර එය අතීත අත්තනෝ පද ක්‍රියාවට සමානය. අතීත කාලික කර්මකාරක ක්‍රියාවක් හා අතීත කාලික අත්තනො පද ක්‍රියාවක් වරනැඟු විට මෙම සමාා්‍යය පැහැදිලි වනු ඇත.

| **කර්ම කාරක ක්‍රියාව** | | | **අත්තනෝ පද ක්‍රියා** | | |
|---|---|---|---|---|---|
| **අතීත** | | | **අතීත** | | |
| දැවිණි | - | දැවුණු | නික්මිණි | - | නික්මුණු |
| දැවිණිහි | - | දැවුණුහු | නික්මිණිහි | - | නික්මුණුහු |
| දැවිණිම් | - | දැවුණුමු | නික්මිණිම් | - | නික්මුණුමු |
| **ප්‍රත්‍යය** | | | **ප්‍රත්‍යය** | | |
| ඉණි | - | උණු | ඉණි | - | උණු |
| ඉණිහි | - | උණුහු | ඉණිහි | - | උණුහු |
| ඉණ්හි | - | උණුමු | ඉණ්මි | - | උණුමු |

**වර්තමාන කර්තෘ කාරක ක්‍රියා/ආඛ්‍යාතය**

**සුසිරි වතුරෙන් ඇණියඟ වැසේ**
(සුචරිත නැමැති ජලය ප්‍රවාහයෙන් අනුමාත්‍ර වූ හෙවත් ස්වල්ප වූ පාපය වැසේ)

ඉහත නිදසුනෙහි 'වැසේ' යනු වර්තමාන කර්මකාරක ක්‍රියාවක් වන අතර එය වර්තමාන අත්තනෝ පද ක්‍රියාවකට සමානය. වර්තමාන කර්මකාරක ක්‍රියාවක් හා වර්තමාන අත්තනෝ පද ක්‍රියාවක් වර නැඟූ විට මෙම සාම්‍යය පැහැදිලි වෙයි.

| | | | |
|---|---|---|---|
| **කර්මකාරක ක්‍රියාව** | | **අත්තනෝ පද ක්‍රියාව** | |
| **වර්තමාන** | | **වර්තමාන** | |
| වැසේ | වැසෙති | කිපේ | කිපෙති |
| වැසෙහි | වැසෙහු | කිපෙහි | කිපෙහු |
| වැසෙමි | වැසෙමු | කිපෙමි | කිපෙමු |
| **ප්‍රත්‍යය** | | **ප්‍රත්‍යය** | |
| ඒ | එති | ඒ | එත් |
| එහි | එහු | එහි | එහු |
| එමි | එමු | එමි | එමු |

**අනාගත කර්මකාරක (කෘදන්ත) ක්‍රියාව**

**සසුන් පිරියතැ දුණාන් විසින් සතර රූ මැවෙන්නේ**
(ශාසනයේ කෙළවර ධාතුන් විසින් ශාස්තෘන් වහන්සේගේ රූපය මැවෙන්නේය.)

මෙහි 'මැවෙන්නේ' යනු කර්මකාරක කෘදන්ත ක්‍රියාවකි. සිදත් සඟරාවට අනුව අනාගත ක්‍රියාවකි. මෙය අත්තනෝ පද කෘදන්ත ක්‍රියාවක් සමග වර නැඟූ විට මෙම ක්‍රියා රූප දෙකෙහි සාම්‍යය වැටහෙනු ඇත.

| | |
|---|---|
| **කර්මකාරක (කෘදන්ත) ක්‍රියා** | **අත්තනෝ පද ක්‍රියා - අතීත** |
| මැවෙන්නේ- මැවෙන්නෝ | යැපෙන්නේ - යැපෙන්නෝ |
| මැවෙන්නෙහි - මැවෙන්නෙහු | යැපෙන්නෙහි - යැපෙන්නෙහු |
| මැවෙන්නෙහි - මැවෙන්නෙමු | යැපෙන්නෙමි - යැපෙන්නෙමු |

ඉහත නිදසුන්වලින් පෙනී යන්නේ කර්මකාරක ක්‍රියා හා අත්තනෝ පද ක්‍රියා අතර අර්ථ වශයෙන් අසමාන වුව ද රූපීය වශයෙන් ඇති සමානත්වයයි. කර්මකාරක ක්‍රියාවකින් කර්මය උක්ත වන අතර අත්තනෝ පද ක්‍රියාවකින් කර්තෘ උක්ත වෙයි.



**භාව කාරක ක්‍රියාව/ ආඛ්‍යාතය**

භාවකාරක ක්‍රියා ද අත්තනෝ පද ක්‍රියා සමග සාකල්‍යයෙන් ම සමාන වෙයි. භාවකාරක ක්‍රියාව පාලි ව්‍යාකරණයෙහි විස්තර වන්නේ මෙපරිද්දෙනි.

**භාවෝකාරකමිස්සෝ සුද්ධෝ ධාත්වත්ථෝ තස්සේකත්තා -**
**ඒක වචන මෙව. තඤ්ච පඨම පුරිසේ ඒව හෝති**[6]
(භාව නම් කාරකයන්ගෙන් අමිශ්‍ර වූ ධාත්වර්ථයයි. ඒ භාවය එකක් බැවින් ඒක වචන ම වේ. එය ද ප්‍රථම පුරුෂයෙහි වේ.)

| | | | | |
|---|---|---|---|---|
| ළමයාට පෙනේ | - | ඒ | - | ප්‍රත්‍යය |
| ළමයාට පෙනිණි | - | ඉණි | - | ප්‍රත්‍යය |
| ළමයාට හැඬේ | - | ඒ | - | ප්‍රත්‍යය |
| ළමයාට හැඬිණි | - | ඉණි | - | ප්‍රත්‍යය |

මෙම භාව කාරක ක්‍රියා රූප හා ප්‍රත්‍යය අත්තනෝ පද ක්‍රියා රූප හා ප්‍රත්‍යය සමග සමාන බව ඉහත සඳහන් නිදසුන්වලින් පැහැදිලි වනු ඇත.

**නිරුත්සාහක ක්‍රියාව/ආඛ්‍යාතය**

සිදත් සඟරාවෙහි කර්මකාරක ක්‍රියාව යටතේ '**නිතැතින් සැපයෙන කතු අරුත් හටද මේ පස රුසී බැබැළිණි. ඈ ගී කුසුල් තෙම බිඳේ, මෙ ඈ තෙම කතු තෙම කම් නම්**[7] යන ප්‍රකාශයට අනුව නිරුත්සාහක ක්‍රියාවනට කර්මකාරක ක්‍රියාවට යොදන ප්‍රත්‍යය ම යෙදෙන බව කියවෙයි.

**සඳ බැබළිණි**
**කුසුල් තෙම බිඳේ**

මෙම වැකිවල ඇති '**බැබළිණි**' '**බිඳේ**' යන නිරුත්සාහක ක්‍රියා රූප අත්තනෝ පද ක්‍රියාරූප සමග හොඳින් ගැළපෙන බව පරණවිතාන සූරීහූ ද පවසති[8] එම නිරුත්සාහක ක්‍රියාව පාලි ව්‍යාකරණයේ '**කර්ම කර්තෘක**' ආඛ්‍යාතය ලෙස හැඳින්වෙයි. එම නිරුත්සාහක ක්‍රියාව සමග බැඳී පවතින උක්ත පදය කර්මය ලෙසින් ද කර්තෘ ලෙසින් ද පිළිගනු ලබයි. තෙමෙ කතු තෙම කම් (ස්වයං කර්තෘ ස්වයං කර්ම) යනුවෙන් හඳුන්වා ඇත්තේ එබැවිනි.

මේ අනුව බලනවිට පෙනී යන්නේ කර්මකාරක, භාවකාරක, නිරුත්සාහක (කර්ම කර්තෘක) ක්‍රියා සඳහා යොදන ක්‍රියා රූප හා ප්‍රත්‍යය අත්තනෝ පද ක්‍රියා රූප හා ප්‍රත්‍යය සමග සාකල්‍යයෙන් ම සමානත්වයක් දක්වන බවයි. එහෙත් අත්තනෝ පද ක්‍රියාවෙන් කර්තෘ උක්ත වන අතර කර්මකාරක ක්‍රියාවෙන් කර්මය උක්ත වෙයි. නිරුත්සාහක ක්‍රියාවෙන් එම ක්‍රියාව හා බැඳී පවතින පදය උක්ත කර්තෘ ලෙසත්, උක්ත කර්මය ලෙසත් (තෙම කම් තෙම කත) පිළිගනු ලබන අතර භාවකාරක ආඛ්‍යාතය උක්ත වියුක්ත වෙයි.

**ආන්තික සටහන්:**

1. **සබ්දනීතිප්පකරණං**, ii පරිච්ඡේදය.
2. **නිරුක්තිදීපනී**, ආඛ්‍යාත කාණ්ඩය.
3. සාරස්වතී ව්‍යාඛ්‍යාව, (සංස්) රතනසාර හිමි, කහවේ, 1920, 519 පිටුව.
4. පරණවිතාන, සෙනරත්, සීගිරි ගී - වියරණ. 194 පිටුව
5. බාලාවතාරය, (සංස්) පේමරතන හිමි, වැලිවිටියේ 1944, 197 පිටුව.
6. එම, 1944, 199 පිටුව.
7. සිදත් සඟරා භාව සන්නය, (සංස්) රතනසාර හිමි, කහවේ, 1956, 273 පිටුව.
8. පරණවිතාන සෙනරත්, සීගිරි ගී - වියරණ, 1962, 195 පිටුව.

**ආශ්‍රිත ග්‍රන්ථ:**


1. කුමාරතුග මුනිදාස, **ක්‍රියා විවරණය**, 1956.
2. **නිරුක්තිදීපනී.**
3. පරණවිතාන, සෙනරත්, **සීගිරි ගී - වියරණ**, 1962.
4. **සබ්දනීතිප්පකරණං.**
5. **සාරස්වතාත්ථී ව්‍යාඛ්‍යාව** (සංස්) රතනසාර හිමි, කහවේ, 1950.
6. **සිදත් සඟරා භාව සන්නය,** (සංස්) රතනසාර හිමි, කහවේ, 1956.
7. සේනාධිර, ගුණපාල, **නිවැරැදි වහර**, 1984.


# V. D. de Lanarolle

## The First Sinhala Short Story Writer

**Kulathilaka Kumarasinghe**

1920 සිට 1945 දක්වා කාලය දළ වශයෙන් සිංහල කෙටිකතාවේ ද්විතීයික අවධිය ලෙස සැලකේ. මාර්ටින් වික්‍රමසිංහ හා වී. ඩී. ද ලැනරෝල් අයත් වන්නේ කාලාවධියට ය. මේ යුගය නියෝජනය කරන සෙසු ලේඛකයන් ලෙස ඩබ්ලියු. ඒ. සිල්වා, හේමපාල මුනිදාස හා ටී. ජී. ඩබ්ලිව්. ද සිල්වා යන අය දැක්විය හැකි ය. මාර්ටින් වික්‍රමසිංහ සූරීන්ගේ 'අහිරහස' කෙටිකතාව ප්‍රථම සිංහල කෙටිකතාව ලෙස හඳුන්වා දෙනු ලැබූයේ මාර්ටින් වික්‍රමසිංහ - කෙටිකතා පළමු වෙළුමට 'සිංහල කෙටිකතාවේ ප්‍රභවය' යන හිසින් ලිපියක් සම්පාදනය කෙරුණු මහාචාර්ය ඒ. වී. සුරවීර විසිනි. ඔහු පවසන ආකාරයට වර්ෂ 1924 අප්‍රේල් 25 දින මේ කතාව දිනමිණ පුවත්පතේ පළ වී ඇත. එම කතාව 1923 දී දිනමිණ පුවත්පතේ ම පළ වූ 'උපාසක මහත්තයා' නම් කතාවත් සමග සසඳන විට මා දුටු විශේෂත්වය නම් කථ වස්තුවලින් මිදී බොහෝ දුරට ම කෙටිකතා කලාවේ මුඛ්‍ය ලක්ෂණ ග්‍රහණය කර ගනිමින් කතාව ගොනු කිරීමේ කුශලතාවක් 'අහිරහස' කතාවට වඩා 'උපාසක මහත්තයා' කතාවෙන් ප්‍රකට වීම ය.

වී. ඩී. ද ලැනරෝල් දිනමිණ ඇතුළු වෙනත් පුවත්පත්, සඟරාවලට කෙටිකතා රචනා කළ ද සාහිත්‍යාංගයක් වශයෙන් කෙටිකතාව පෝෂණය කිරීමට වැඩි අවධානයක් යොමු කර නැත. ඔහු විසින් රචනා කරන ලද එක ම කෙටිකතා සංග්‍රහය 'බක තපස් හෙවත් ආලය'යි.

'නරක් වූ පිටි බඳුන' කෙටිකතාව මැනවින් සංශෝධනය කොට 1924 ඔක්තෝබර් මස පළ වූ වික්‍රමසිංහගේ මුල් කෙටිකතා සංග්‍රහය වන 'ගැහැනියක්'හි සංගෘහිත ව ඇත. වික්‍රමසිංහ ඇතුළු මේ යුගය නියෝජනය කරන සෑම ලේඛකයෙකුට ම කතා රචනා කිරීමට සිදු

© **Senior Professor Kulathilaka Kumarasinghe**

සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු
**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 22 කලාපය, 2014/2015**
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය